**කොළඹ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම හා ගම්පහ කාර්මික විද්‍යාලය වැඩිදියුණු කිරීම පිළිබඳ ව්‍යාපෘතිය - 2016**

---

කොළඹ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම හා ගම්පහ කාර්මික විද්‍යාලය වැඩිදියුණු කිරීම පිළිබඳ ව්‍යාපෘතියේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා කොරියානු අපනයන - ආනයන බැංකුව අතර 2013 ජුලි 23 දින එළඹි අංක 2013033/එස්එල්-එස්ආර්අයි-22 දරන ණය ගිවිසුම යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ණය ගිවිසුම අනුව, එවකට තරුණ කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය වර්තමානයේ නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ හා ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වනුයේ, කොළඹ හා ගම්පහ වෘත්තීය පුහුණු මධ්‍යස්ථාන 02 ක් පිහිටුවීම හා සංවර්ධනය කිරීම සහ තාක්ෂණික මාරු කිරීම් හා ආර්ථික සංවර්ධනයේදී කොරියානු විශේෂඥයින්ගේ සහය සහිතව කර්මාන්ත වර්ධනයට අනුබල දීම හා මානව සම්පත් සංවර්ධනයේදී ප්‍රධාන කාර්ය භාරයක් සිදු කිරීමයි. ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 31.41 ක් වන අතර ඉන් එජඩො මිලියන 26.05 ක් කොරියානු අපනයන - ආනයන බැංකුව විසින් මූල්‍යායනය කිරීම සඳහා එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2013 නොවැම්බර් 18 දින ආරම්භ කරන ලද අතර 2016 නොවැම්බර් 18 වන විට නිම කිරීමට නියමිතව තිබුණි. කෙසේ වුවද ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2018 ජුනි 12 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමණාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම කළමණාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය

ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කල මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය සහ ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනිම ආදිය දැක්වෙන පරිදි අඛන්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වාගෙන යනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කර ගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව, සහ

(උ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(ඌ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**2. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**2.1 මතය**

**------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මාගේ මතය වනුයේ,

(අ) 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2016 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

## 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදන සහ සමාලෝචිත වර්ෂය තුළ හා 2016 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන් කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2016 දෙසැම්බර් 31 දක්වා | |
| | එජඩො මිලියන | රු. මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන | එජඩො මිලියන | රු. මිලියන |
| ඊඩීසීඑෆ් | 26.05 | 3,461 | 1,000 | 5.75 | 748 | 6.59 | 857 |
| ශ්‍රීලංර | 5.36 | 711 | 200 | 0.16 | 20 | 0.36 | 47 |
| | **31.41** | **4,172** | **1,200** | **5.91** | **768** | **6.95** | **904** |

## 3.2 භෞතික ප්‍රගතිය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනයට ලද තොරතුරුවලට අනුව, කොළඹ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ඉදිකිරීම හා ගම්පහ කාර්මික විද්‍යාලය වැඩිදියුණු කිරීම පිළිබඳ ව්‍යාපෘතියේ මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කර තිබුණු අතර ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට, ව්‍යාපෘති කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා කැපවුණු කාර්ය මණ්ඩලයක් ස්ථාපිත කිරීමේ ප්‍රමාදය ඊට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ගොඩනැගිලි ඉදිකිරීම සඳහා උපදේශක පත්කිරීම 2014 අගෝස්තු 22 දින දක්වා ප්‍රමාද වී තිබුණු අතර ගොඩනැගිලි දෙකෙහි ඉදි කිරීමේ වැඩ විදේශ සමාගමකට පවරා තිබුණේ 2016 ඔක්තෝබර් 12 දින දීය. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම අනුව, ගොඩනැගිලි ඉදි කිරීමේ වැඩ 2018 ජුනි 29 දින නිමකිරීමට සැලසුම් කර තිබුණි. කෙසේ වුවද 2016 දෙසැම්බර් 31 දිනට ඉදිකිරීම් වැඩ කටයුතුවල ප්‍රගතිය සියයට 10 ක්ව පැවතුණි. මේ අනුව ව්‍යාපෘති කාලපරිච්ඡේදය තුල ඉදිකිරීම් වැඩ සම්පූර්ණ කිරීම සැක සහිතව පැවතුණි.

(ආ) ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්යයන්ට අමතරව ව්‍යාපෘතියෙන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත අනෙකුත් කාර්යයන් එනම් උපකරණ මිළදී ගැනීම, පෙළපොත් සංවර්ධනය, හා කියවීම් උපකරණ, ගුරුවරුන්ට විදේශ පුහුණු හා දේශීය පුහුණු ලබාදීම ආදී කාර්යයන් ණය ගිවිසුමේ දිනයේ සිට මාස 30 ක කාලයක් ඇතුළත නිම කිරීමට සැලසුම් කර තිබුණද මෙතෙක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

## 3.3 මානව සම්පත් කළමණාකරණය

-------------------------------------

ව්‍යාපෘතිය විසින් 2016 දෙසැම්බර් 10 දින බඳවා ගන්නා ලද ව්‍යාපෘති අධ්‍යක්ෂ වෙත 2016 මාර්තු 24 දිනැති අංක 1/2016 දරන කළමණාකරණ සේවා චක්‍රලේඛයේ 2.2.5 (අ) ඡේදයේ දක්වා ඇති පරිදි ප්‍රමාණවත් පලපුරුද්දක් නොතිබූ බව නිරීක්ෂණය විය.

## 3.4 මූල්‍ය පාලන පිළිබඳ ගැටළු

-----------------------------

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 133 හා 2010 ජුලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව ව්‍යාපෘති ගනුදෙනු පිළිබඳ කාර්යයන් රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකයේ විගණනයට භාජනය කර නොතිබුණි.